'පැලියගොඩ "පොලිස් පහරදීමේ" ඇත්තම කතාව මෙන්න' යන සිරස්තලයෙන් යුතුව දිවයින ඉරිදා සංග්‍රහයේ (03/14) පළවී තිබූ ලිපියකි. එම ලිපියේ අන්තර්ගතයන් සම්බන්ධයෙන් අපගේ නිරීක්ෂණ මෙසේ පෙළගස්වමු.

1) මෙම ලිපිය ආරම්භ කරන විට, මෙම සිදුවීමේ අගමුල සොයා ගොස් අනාවරණය කරගත් සියල්ල සටහන් කර ඇති බව මාධ්‍යවේදියා සඳහන් කරයි. එහිදී අදාළ වැඩ තහනමට ලක්වූ ප්‍රධාන පොලිස් පරීක්ෂක ලින්ටන් සිල්වා මහතාගෙන් කරුණු විමසූ බවද සඳහන් කෙරේ. කෙසේ නමුත්, මෙහිදී මිගාර ගුණරත්න පාර්ශවය වෙත සම්පූර්ණයෙන්ම වරද පටවමින් ලිපිය ලියා තිබුණත්, ඒ සම්බන්ධයෙන් මිගාර ගුණරත්නගෙන් හෝ එම පාර්ශවයෙන් කිසිදු කරුණු විමසීමක් සිදුකර ඇති බවක් ලිපියේ සඳහන් නොවේ. ඒ අනුව, මෙම දිවයින ලිපිය පාඨක අප වෙත ඉදිරිපත් කරන්නේ සිදුවීමේ එක් පාර්ශවයක් පමණි. එසේ නම් මෙය ඒකපාර්ශ්වික වාර්තාකරණයක් නොවන්නේද?

2) යම් කිසි ප්‍රවෘත්තියක යම් වාර්ගිකත්වයක් සඳහන් වන්නේ නම්, එම වාර්ගිකත්වය පුවතේ කරුණු කාරණාවන්ට හෝ සිදුවීම් වලට ඍජුව අදාළ නොවන්නේ නම්, මාධ්‍ය ආචාර ධර්ම නිර්දේශයන්ට අනුව එවැනි වාර්තාකරණයන් මාධ්‍ය ආචාර ධර්ම උල්ලංඝනයන් වේ. කෙසේ නමුත් මෙම ලිපිය තුළ අන්තර්ගතයේ දිගින් දිගටම "මුස්ලිම්" යනුවෙන් කරනා සඳහන් කිරීම්, මෙම පුවතට අදාළ වන්නේ කුමන පදනමකින්ද? එවැනි පදනමක් නැති නම්, මෙය මාධ්‍ය ආචාර ධර්ම උල්ලංඝනය කිරීමක් නොවන්නේද?

මේ සම්බන්ධයෙන් ඔබේ අදහස් මොනවාද?

#MediaEthicsSL #lkr #SundayDivaina